# ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලි
# සම්පාදන ප්‍රතිපත්ති

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය

# ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලි
# සම්පාදන ප්‍රතිපත්ති

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
ප්‍රථම මුද්‍රණය 2002

ISBN 955-8383-17-1

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදන ප්‍රතිපත්ති.- කොළඹ :
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය, 2002.
පි. ii, 10 ; සෙමී 22.
ISBN 955-8383-17-1

i. 015.5493 ඩිවී 21 ii. ග්‍රන්ථ නාමය
1. ජාතික ග්‍රන්ථ නාමාවලි - ප්‍රතිපත්ති

මුද්‍රණය හා ප්‍රකාශනය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය,
තැ.පෙ. 1764,
අංක 14, නිදහස් මාවත,
කොළඹ 07,
දුරකථනය: 685195, 698847
ෆැක්ස් : 941-685-201

පිටකවර මුද්‍රණය:සී. පී. ප්‍රින්ටර්ස්, ගංගොඩවිල.

# පෙරවදන

ජාතික ග්‍රන්ථ නාමාවලිය යනු ඕනෑම රටක ප්‍රකාශන නිකුතුව පිළිබඳව සම්පාදනය කරනු ලබන ප්‍රධානත ම මූලාශ්‍ර ග්‍රන්ථය වේ. ශ්‍රී ලංකාවේ 1963 වසරේ දී ඇරඹි ජාතික ග්‍රන්ථ නාමාවලීකරණය මේ දක්වා අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබේ.

මෙම කාල පරාසය තුළ ප්‍රකාශන ක්ෂේත්‍රය ආකෘතික මෙන් ම අන්තර්ගත වශයෙන් ද බහු විධ විපර්ණාමයන්ට ලක් වූ බව ප්‍රකට කරුණකි. ජාතික ග්‍රන්ථ නාමාවලිය තුළින් මෙම වෙනස්කම් පිළිඹිබු විය යුතු බව නූතන පුස්තකාලවේදීන්ගේ අදහස වේ. මෙම කරුණු සැලකිල්ලට ගත් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනයේ දී අනුගමනය කරණු ලබන ප්‍රතිපත්ති යාවත් කාලීන කිරීමට පියවර ගන්නා ලදී.

මෙම ප්‍රතිපත්ති මාලාව සකස් කරන ලද්දේ ශ්‍රී ලංකාවේ පුස්තකාල හා ග්‍රන්ථ නාමාවලිකරණ ක්ෂේත්‍රයේ විද්වත් කමිටුවක නිර්දේශවලට අනුකූලවය. දැනට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනයේ දී අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති අධ්‍යයනය කර ඒවා කෙතෙක් දුරට වර්තමාන තත්ත්වයන් හා ගැලපේ දැයි සලකා බැලීමක් මෙහිදි සිදු කෙරිණි. එමෙන්ම ලෝකයේ ප්‍රධාන ග්‍රන්ථ නාමාවලි ප්‍රතිපත්ති සමඟ ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ

ප්‍රතිපත්ති සංසන්දනය කිරීමත් ග්‍රන්ථනාමාවලීකරණයේ අන්තර්ජාතික ප්‍රවනතා හඳුනා ගෙන ඒවා ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියට ආදේශ කරගත හැකි අයුරු විමසා බැලීමත් සිදු කරන ලදී. තවද, 1977 දී පැරිසියේ පැවති ජාතික ග්‍රන්ථ නාමාවලී පිළිබඳ අන්තර්ජාතික සමුළුවේ සහ 1998 දී කෝපන්හේගන් නුවර පැවති ජාතික ග්‍රන්ථ විඥාපන සේවා පිළිබඳ අන්තර්ජාතික සමුළුවේ නිර්දේශ කෙරෙහි ද අවධානය යොමු කරන ලදී.

මේ අනුව සකස් කරන ලද මූලික ප්‍රතිපත්ති පිළිබඳ විස්තර මෙම පොත් පිංචෙහි ඇතුළත් වේ. මෙය ස්ථාවර ප්‍රතිපත්ති මාලාවක් නොවන අතර කාලීන අවශ්‍යතා සහ වර්ධනයන්ට සාපේක්ෂව සංශෝධනවලට ලක් කරනු ඇත.

මෙම ප්‍රතිපත්ති මාලාව සකස් කිරීමේ දී සහාය වූ විද්වතුන් සියලු දෙනාටත් ග්‍රන්ථ විඥාපන අංශයේ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාව පුද කරමි.


එම්. එස්. යූ. අමරසිරි<br>
අධ්‍යක්ෂ ජනරාල්

ජාතික පුස්තකාල හා<br>
ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය<br>
14, නිදහස් මාවත<br>
කොළඹ 07.


2002 මාර්තු

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදන ප්‍රතිපත්ති

1. ආවරණය (Coverage)

1.1. පහත සඳහන් ප්‍රකාශන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය මගින් ආවරණය කෙරේ.

1.1.1. සියලුම භාෂාවලින් ප්‍රකාශිත නිදහස් ප්‍රවේශයක් සහිත නවතම ජාතික ප්‍රකාශන

1.1.2. ශ්‍රී ලාංකික මෙන් ම වෙනත් ලේඛකයන් විසින් රචිත විදේශයන්හි මුද්‍රිත / ප්‍රකාශිත, ශ්‍රී ලංකාවට සම්බන්ධ ප්‍රකාශන.

1.1.3. විදේශීය රටවල මුද්‍රිත / ප්‍රකාශිත සිංහල ප්‍රකාශන.

1.1.4. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙන් අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ලබාගෙන විදේශයන්හි මුද්‍රිත / ප්‍රකාශන.

1.1.5. ප්‍රකාශක හෝ ප්‍රකාශන ස්ථානය වෙනස් වී ඇති හෝ අලුතින් අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකයක් ලබා ඇති පුනර් මුද්‍රණ.

1.2 පුළුල් ලෙස වර්ග කර ඇති පහත සඳහන් ප්‍රකාශන ප්‍රතිපත්තියක් වශයෙන් ඊට ඇතුළත් විය යුතුය.

### 1.2.1 මුද්‍රිත කෘති (Printed books)

i. පොත් (පිටු 49 ට වැඩි)
ii. වාර ප්‍රකාශන (පළමු කලාපය පමණක්)
iii. පුස්තිකා (පනත්, කෙටුම්පත් සහ වෙනත් නීතිමය ප්‍රකාශන සඳහා පිටු සංඛ්‍යාව සැලකිල්ලට ගැනීම අවශ්‍ය නොවේ. සංස්කෘතික, ඓතිහාසික හා දීර්ඝ කාලීන විෂයබද්ධ වටිනාකමක් ඇති පිටු 20 ට වැඩි සියලුම පුස්තිකා ඇතුළත් විය යුතුය. මෙම වර්ග වලට අයත් නොවන පත්‍රිකා සඳහා කෙටි කාලීන අගයකින් යුත් ප්‍රකාශන ලැයිස්තුවක් සකස් කළ යුතුය)
iv. ප්‍රමාණාත්මක, ගුණාත්මක සහ පර්යේෂණාත්මක වටිනාකමක් ඇති ග්‍රන්ථ නාමාවලි / අනුක්‍රමණිකා
v. මුද්‍රිත සිතියම් - වෙනම ප්‍රකාශිත සංචාරක සිතියම් ද ඇතුළු
vi. සිතියම් පොත්
vii. මුද්‍රිත සංගීත කෘති
viii. ළමා හා යොවුන් සාහිත්‍ය කෘති (මෙහිදී පිටු සංඛ්‍යාව පිළිබඳව සැලකීම අවශ්‍ය නොවේ)

ix. ඡායාරූප එකතු

x. පොත් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති රූප සටහන්, ප්‍රස්ථාර, සැලසුම්, කාටූන්

xi. ජාතික වශයෙන් වැදගත් ව්‍යුහ පිළිබඳ මුද්‍රිත සැලසුම් එකතු (Printed plans of important national structures)

xii. වට්ටෝරු පොත් (Inventories)

xiii. රසායනාගාර සංග්‍රහ (Laboratary manuals)

xiv. රජයේ ප්‍රකාශන

xv. සමිති, සමාගම් හා රාජ්‍ය නොවන සංවිධාන මගින් නිකුත් කරන ප්‍රකාශන (ප්‍රචාරක සාහිත්‍ය හා වාර්ෂික වාර්තා හැර)

xvi. වාර්තා

## 1.2.2 සූක්ෂම රූපණ (Microforms)

i. අලෙවිය සඳහා ඇති ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සූක්ෂම රූපණ (සූක්ෂම සේයා පට සහ සේයා පත්‍ර Microfilms and Microfiche)

ii. අලෙවිය සඳහා ඇති විදේශයන්හි නිෂ්පාදිත ශ්‍රී ලංකාව පිළිබඳ සූක්ෂම රූපණ.
(ශ්‍රී ලාංකීය විද්වතුන් විසින් විදේශීය විශ්ව විද්‍යාලවලට ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධවල සූක්ෂම රූපණ ද මීට ඇතුළත් විය යුතුය)

### 1.2.3 ශ්‍රව්‍ය පට (Audio tapes) / සංගෘහිත තැටි (Compact discs)

අලෙවිය හෝ නොමිලේ බෙදා හැරීම සඳහා ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ශ්‍රව්‍ය පට සහ සංගෘහිත තැටි

### 1.2.4 චිත්‍රපට සහ වීඩියෝ පට (Films and Video tapes)

අසභ්‍ය කෘති හැර මහජන ප්‍රදර්ශනය සඳහා ඇති ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කර බෙදා හරිනු ලබන චිත්‍රපට හා වීඩියෝ පට

### 1.2.5 විද්‍යුත් ප්‍රකාශන (Electronic publications)

දේශීය වශයෙන් අලෙවිය සඳහා ඇති ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කර බෙදාහරිනු ලබන පරිගණක මෘදුකාංග, ශ්‍රී ලංකාවට සෘජුවම සම්බන්ධ අන්තර්ජාල සම්පත්.

### 1.2.6 බහු මාධ්‍ය කට්ටල (Multimedia kits)

එක් මාධ්‍යයකට වඩා ප්‍රයෝජනයට ගනිමින් සකස් කරන ලද ප්‍රකාශන. උදා. මුද්‍රිත කොටස්, ස්ලයිඩ්ස් , ශ්‍රව්‍ය පිටු (audio pages) හා සංගෘහිත තැටි ආදිය ඇතුළත් අධ්‍යයන කට්ටල

## 1.2.7 රජයේ ප්‍රකාශන (Government publications)

i. සියලුම පාර්ලිමේන්තු ප්‍රකාශන
ii. නීතිමය බලය ඇති ප්‍රධාන විධායකය (ජනාධිපති ලේකම් කාර්යාලය) විසින් නිකුත් කරනු ලබන ප්‍රකාශන
iii. සියලුම දෙපාර්තමේන්තු සහ අයතනවල ප්‍රකාශන
iv. පළාත් සභා, පළාත් පාලන ආයතන ප්‍රකාශන (ඉහත ආයතන මගින් නිකුත් කරනු ලබන විනෝදාත්මක හා ප්‍රචාරක සාහිත්‍ය කෘති ඉවත් කළ යුතුය)

## 1.3 කෙටිකාලීන කෘති (Ephamara)

පහත සඳහන් කෙටි කාලීන කෘති ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියට ඇතුලත් නොවේ.

i. පත්‍රිකා (Leaflets)
ii. පෝස්ටර් (Posters)
iii. වැඩ සටහන් (Programmes)
iv. ආරාධනා පත්‍ර (Invitation cards)
v. සමරු කලාප (Souvenirs)
vi. පොත් සලකුණු (Book marks)

vii. ප්‍රචාරක පත්‍රිකා (Brochers)

viii. ප්‍රදර්ශන භාණ්ඩ නාමාවලි (Exhibition catalogues)

ix. පුස්තිකා (Pamphlets)

x. ඡායාරූප (Photographs)

xi. පුවත් පත් ලිපි (Newspaper articles)

xii. කෑම වට්ටෝරු (Menus)

xiii. සංචාරක නියමු (Tourist guides)

xiv. අත් පත්‍රිකා (Hand outs)

xv. ආකෘති පත්‍ර (Forms)

xvi. ප්‍රචාරක දැන්වීම් (Advertisements)

xvii. පෝස්ට් කාඩ් (Post cards)

xviii. පින්තූර පෝස්ට් කාඩ් (Picture post cards)

xix. ප්‍රචාරක සාහිත්‍ය (Propagandic literature)

## 2. ඉදිරිපත් කිරීම (Presentation)

ඉෆ්ලා ආයතනයේ විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය (Universal Bibliographic Control (UAP) සහ අන්තර්ජාතික මාර්ක් හර වැඩසටහනට (MARC core programme) අනුබද්ධිතව 1998 කෝපන්හේගන් නුවර පවත්වන ලද ජාතික ග්‍රන්ථ විඥාපන සේවා පිළිබඳ

අන්තර්ජාතික සමුළුවේ නිර්දේශ අනුව ක්‍රියා කරනු ලැබේ. මේ අනුව මුද්‍රිත හෝ මුද්‍රිත නොවන ඕනෑම ස්වරූපයකින් ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කළ හැකිය. ඒ හැමවිටම අන්තර්ජාතික ප්‍රමිති අනුගමනය කිරීම.

* කිසියම් ප්‍රකාශනයක් පළ වූ විගස ම එය ජාතික ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් කිරීම.

* ජාතික ග්‍රන්ථ නාමාවලිය කුමන ස්වරූපයකින් පළ කළත් එය හඳුනාගැනීම සඳහා පහත සඳහන් තොරතුරු ඇතුළත් කිරීම.

(i) ග්‍රන්ථ නාමය
(ii) ආවරණය වන කාල පරාසය
(iii) ප්‍රකාශිත ස්ථානය හා ප්‍රකාශක
(iv) ප්‍රකාශිත දිනය
(v) අන්තර්ජාතික අනන්‍යතා අංකය
(vi) ප්‍රකාශන හිමිකම් තොරතුරු
(vii) ප්‍රකාශනගත සූචිකරණ සංලේඛ (තිබේ නම්)
(viii) ලබා ගත හැකි ආකාරය සහ මිල

* මෙයට අමතරව ජාතික ග්‍රන්ථ නාමාවලිය සඳහා හැඳින්වීමක් සහ අවශ්‍ය අවස්ථාවල දී පරිශීලක නියමුවත් ඇතුළත් කෙරේ. එහිදී පහත සඳහන් තොරතුරු සඳහන් කරනු ඇත.

(i) තොරතුරු මූලාශ්‍ර (ලේඛන ලැබුණු මාර්ග )
උදා: නීතිමය තැන්පතු

(ii) ආවරණය. ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් නොකළ ද්‍රව්‍ය පිළිබඳව ද සඳහන් කළ යුතුය.

(iii) අනුකාලිකතාව

(iv) සැකැස්ම

(v) භාවිත කළ ග්‍රන්ථ විද්‍යාත්මක මෙවලම්. උදා. වර්ගීකරණ සහ සූචිකරණ මෙවලම්

(vi) භාවිත කළ විශේෂ යෙදුම් හා ඒවායේ නිර්වචන හා හැකුළුම් පද

(vii) වර්ගීකරණ ක්‍රමයෙහි දළ සටහනක්

(viii) ගොනු කිරීමේ ක්‍රමය පිළිබඳ විස්තර

ජාතික ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් කරනු ලබන සංලේඛ සම්පාදනය හා ගොනු කිරීම පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව සිදු කෙරේ.

## 3. අනුක්‍රමණිකාකරණය ක්‍රමය (Indexing system)

දැනට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනයේ දී අනුගමනය කරනු ලබන්නේ පරම්පරා රීතියයි. (Chain Indexing) ඊට අදාළව විෂය ශීර්ෂ සම්පාදනයේ දී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කෙරේ.

3.1 විෂය ශීර්ෂ සකස් කිරීමේ දී ඩිවි දශම වර්ගීකරණයේ විෂය මාතෘකා හා කොංග්‍රස් පුස්තකාල විෂය ශීර්ෂවල සම්මිශ්‍රණයක් භාවිත කිරීම.

3.2 භූගෝලීය හා ඓතිහාසික අනු බෙදීම් සකස් කිරීමේ දී පූර්ව පදය ලෙස විෂය භාවිත කිරීම.

## 4. සාමූහික සූචිකරණය (Cooperative cataloguing)

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ආවරණය පුළුල්වීමත් සමඟ සූචිකරණ කටයුතු ද පුළුල් කළ යුතුව ඇත. විශේෂයෙන් ශ්‍රව්‍ය පට, වීඩියෝ පට, චිත්‍රපට ආදිය සූචිකරණයේ දී ඒවා නිෂ්පාදනය කරනු ලබන සහ මෙම ද්‍රව්‍ය ආශ්‍රිතව පුස්තකාල පවත්වා ගෙන යන ආයතනවල සහයෝගය ලබා ගැනීම.

## 5. සහාය සේවා (Supportive services)

මෙහිදී ප්‍රධාන වශයෙන් ම වැදගත් වන්නේ සාධිකාර් ලේඛන පවත්වා ගෙන යාමය. ඒ අනුව කර්තෘ, ග්‍රන්ථ නාම, ග්‍රන්ථ මාලා, සංස්ථා නාම හා විෂය යනාදී අංශ ආවරණය වන පරිදි ජාතික සාධිකාර් ගොනු සකස් කිරීම.

ජාතික ග්‍රන්ථ නාමාවලී සම්පාදනයේ දී පිළිගත් මූලාශ්‍ර ග්‍රන්ථ භාවිත කිරීම.

## 6. සමුච්චිත වෙළුම් (Cumulative volumes)

වාර්ෂිකව සමුච්චිත වෙළුම් සම්පාදනය කිරීම . සමුච්චිත වෙළුම්වලට ප්‍රකාශක නාමාවලියක් අන්තර්ගත කිරීම.

## 7. පූර්ව කාලීන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (Retrospective Sri Lanka National Bibliography)

මෙහිදී ද ප්‍රවර්තන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනයේ දී භාවිත කරනු ලබන ප්‍රතිපත්ති හා ප්‍රමිති අනුගමනය කිරීම.

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/23
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ..................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..................

Date : 2017/10/23

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*